කොරෝනාවෙන් අවුල් වූ ඉන්දියානු බෞද්ධයන්ගේ මඟුල්-අවමඟුල් සිරිත්

ඔළුවෙහි ලළලිරුරේ...

මේ දිවුණවල මාධ්‍ය මිත්තේ අපට අසන්නට දක්නට ලැබෙන්නේ කොරෝනා නිසා අසල්වැසි රට වන ඉන්දියාව පත්ව ඇති විනාශකාරී තත්ත්වයයි. රෝගවලිවල බොහොමයකුගේ මළ සිරුරු, එක යාගට දැවෙන දර සහ, තම හිතෙමින්නේ විශේෂ දරාගත නොහැකිවිට විළඳ දෙන මිනිසුන්, රෝහල් පිරී ගම නිසා ඉතා අසරණ වූ රෝගීන්.

මේ සියල්ල අප අසා ඇති පරිදි බුද්ධ කාලයේ සිදුවී යැයි කියන විසාඛා මහතුමාද තත්ත්වයයි.

දිවුලිලියේත් මහරාමඤ්ඤයේත් මෙය වඩාත් තරපහළ බව පැවැසෙයි. ඇතැම්හු සීය පළ කරන්නේ ශ්‍රී ලංකාව ද එවන් තත්ත්වයකට ඇදවැටෙන්දෝ කියා.

ඉන්දියාවේ මහාරාෂ්ට්‍රය බෞද්ධයන් වැඩි වශයෙන් ජීවත්වන ප්‍රාන්තයක් බව පවසන්නේ මුම්බායි නුවර උප්‍රාසක් නගර් හි තක්ෂශිල විද්‍යාලයේ සභාපති නවලෙල ආනන්ද් ලොකු හාමුදුරුවෝය. එම පාසලේ සිසු සිසුවියන් දෙදෙනක් මෙණ උගහුම ලබති.

උන්වහන්සේ මහාරාෂ්ට්‍රයට වැඩම කළේ 1967 දී බල්දෑගම විමලෝභ නායක හිමියන්ගේ ඉල්ලීම් ධර්මදූත කණ්ඩායමට ඇතුළත්වය. අද උන්වහන්සේ ඉන්දියානු පුරවැසිකමකි.

"මම වහන්සේට පවතින තත්ත්වය බලා හිතෙන්නේ කෙසේ ද?යි" ඇසූ විට උන්වහන්සේ පිළිතුරු දුන්හේ, "හතර වටිනාම කොරෝනා අවිව වට කරලා. අපි පස්සෙනෙක් විහරයි දැනට මේගේ ඉන්නේ. පාසල් තිබ්බදු දිගට," යනුවෙනි.

හොවිඩ් නිසා ඇතිවන මරණවලට බෞද්ධ චාරිත්‍ර චාරිත්‍ර කරන්නේ කොහොම ද?

"කොවිඩ් මරණ කිසිවක් නිවෙස්වලට ගේන්නෙ නෑ. ඒවා දැඩි සෞඛ්‍ය නීති රීති යටතේ රජය මගින් ආදාහනාගාරවලට යවනවා. වැඩිපුර පිරිසකට බලන්නවත් ලැබෙන්නේ නෑ. සාමාන්‍යයෙන් නම බෞද්ධ නිවසක මරණෙක් වූ විට බෞද්ධ භික්ෂූන්වහන්සේ නමක් උදාසවල් වගේම ගෙදරට වැඩම කරලා මෘතක වස්තු පූජා කර ඒ සිරිත් විරිත් ඉෂ්ට කරනවා.

හැබැයි මෙහේ ගේදොර පෙරටුවක නමන්නේ නෑ. ඒ සඳහා ලෝහවලින් හෝ එවැනි දෙයකින් හදූ පෙරටුවක් වැනි දෙයක් තියෙනවා. දේහය තබා විවිධ කර සුදු ඇලුම් රෙදිවලින් ඔතනවා. ඒත් පසුව දේහය වෙනත්හට මල් මාලා ආදිය දමා රෙදි කෙහෙන් වසා ඒ මත බෞද්ධ භික්ෂූන්වහන්සේලා දහස් ගණන් ඉන්දියාවෙ ඉන්නවා.

ඒ වුණත් තවමත් බෞද්ධ පවුල්වලට බෞද්ධාචාර්යවරුන් ආගමික කටයුතු මගුල් අවමඟුල් සිරිත් විරිත්වලට සහභාගී වන අවස්ථා තියෙනවා. මහරාෂ්ට්‍රයේ සමහර පන්සල් තියෙනවා බෞද්ධාචාර්යවරු විහරණ ඉන්න. ඒවගේ බෞද්ධ භික්ෂූන්වහන්සේලා නෑ. පාලනය වන්නේ නාගරික බෞද්ධ සභාව මගිනි.

තවත් සමහර පන්සල් තියෙනවා භික්ෂූන්වහන්සේලා හා බෞද්ධාචාර්යවරු ඉන්න." ආනන්ද හිමියෝ පැවැසූහ.

මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ නාෂ්ටුරි බුද්ධත්ව විහාරයේ විහාරාධිපති බිරාති බෞද්ධාචාර්ය හිමියෝය. අම්බෙඩ්කාර්තුමා උක්ත ගයක් සමග බෞද්ධධාගම වැළඳ ගත්තේ නාෂ්ටුරිහිදීය. ඒ නිසා නාෂ්ටුර් ද බෞද්ධ ජනතාව බහුල ගයෙන් හෙසෙන ප්‍රදේශයක් වෙයි.

බෞධාචාර්ය හිමියන් ද ඉන්දියන් ජාතිකයෙකි. එහෙත් උන්වහන්සේ අධ්‍යාපනය ලබා ඇත්තේ ශ්‍රී ලංකාවෙහිය. දිවයිනකාර පිරිවෙනෙන් ද පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයෙන් ද ඉගෙනුම ලැබූ උන්වහන්සේ ශාස්ත්‍රපති උපාධිධරයෙකි.

1990 ගණන්වලදී බෞධාචාර්ය හිමියෝ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ හින්දි වැඩසටහන් සඳහා සම්මන්ත්‍රණ වූහ. ඒ යෂී පෙරේරා (ආගාමප්‍රාප්ත ලේඛිත පෙරේරා මහතාගේ පිරිවර) හින්දි නිවේදිකාවක ලෙස කටයුතු කරන කාලයේදීය.

පාලිත පෙරේරා මහතා ද එකල ගුවන්විදුලියේ නතනතුරු හෙබවූ බව උන්වහන්සේට මතකය. උන්වහන්සේට සිංහල චතුර ලෙස කතා කිරීමට ද හැකිය.

පසුකියදු උන්වහන්සේට කොරෝනා ධනාත්මක වී තිබිණි.

"මම දැන් අටවක් පොය ඉස්සිරිතාලෙ ඉඳලා දැන් පන්සලේදී විවේක ගත්තවා. දවස් 14ක් යනකන් කොහේවත් යන්න එපා කියලයි දෙස්තර මහත්තුරු කිව්වේ."

'මම වඩන්සේට අම්බරවත් වුණේ කැදිලද?'

"මට නිසිං ඇගට පණ නැති වුණා. උණසුවත් හෙම්බිස්සක්කාරයක් හැදුණේ නෑ. දෙස්තර මහත්තුරුන්ට පෙන්නුවාම ඔළුත් කිව්වෙ පෙනහලු ආසාදනය වෙලා කියලා. ඉස්පිරිතාලෙට එන්න කිව්වා. පස්සෙ සීතුන් එකක් කළා. පෙනහලුවල ඔක්සිජන් ලැබෙන එක හොඳටම අඩු වෙලා තිබුණා. පස්සේ සී.ඕ.ආර්. එකක් කළා. එතකොටයි දැනගත්තෙ කොරෝනා කියලද. පස්සෙ ඉස්පිරිතාලෙට ඇතුළත් වුණා."

'ඉන්දියාවෙ ඉස්පිරිතාල ලෙඩුවුන්ගෙන් පිරිලා නේද' මම ඇසුවෙමි.

"ඔව්. මම අඳුනන දෙස්තර මහත්තයෙක් මට ඇඳක් ලබාගන්න උදව් කළා. හැබැයි පෞද්ගලික රෝහලක. ආණ්ඩුවේ ඒවා පිරිලා තමයි."

'මම වඩන්සේට කොහොම ද කොරෝනා බෝ වුණේ?'

"මම වැඩ ඉන්නෙ නාෂ්ටුරිවල ඉඳලා කිලෝමීටර් 10ක් විතර ඈත තියෙන පන්සලක. පන්සල තියෙන්නෙ ගම ඇතුළට පෙන්න. ගෙවල් එහෙම ඒ පැත්තෙ අඩුයි. ඒ නිසා කොරෝනා හැදිච්ච අය අඩුයි ඒ පැත්තෙ. මම මාසෙකට විතර කලින් යියා කිට්ටුව තිබුණ මගුල් ගෙදරකට, මගුල් ගෙදරත් හැත්තෑවක් සීයක් විතර හිටියා. ඒ වුණාට මම වසංගතය ආවට පස්සේ මම ෆේස් මාස්ක් එකක් දානවා."

'මඟුල් ගෙදරකට ගියේ චාරිත්‍ර චාරිත්‍ර කටයුතු ඉටුකරන්න ද?'

"ඔව්. නාෂ්ටුර් බෞද්ධ පවුල්වල මංගල කටයුතු සඳහා බෞද්ධ ස්වාමීන්වහන්සේලා සහභාගී වෙනවා. ඒක විශේෂයෙන්. මගුල් ගෙදර මහාල යුවළ ඉන්නෙ මණ්ඩපයක් වගෙ තැනක. ස්වාමීන්වහන්සේ මංගල්‍ය චාරිත්‍ර පටන් ගන්නකොට මහාල යුවළ අර මණ්ඩපයෙන් පහළට බහිනවා. ඉන් පසුව බුදුන් වඳිනවා. ඒ පසුවිලූ බුදුන් කියනවා. අපි පිරිත් කියනවා. ඉන් පසුව බෞද්ධ ස්වාමීන්වහන්සේ ජයමංගල ගාථා කියනවා.

ශ්‍රී ලංකාවේ නම් මහාල යුවළ සඳහා ජය මංගල ගාථා කියන්නේ දැරිවියන් පිරිසක්. එහෙත් ඉන්දියාවේ බෞද්ධ පවුල්වල මංගලවලදී බෞද්ධ හිමි නමක ජයමංගල ගාථා කීම විශේෂයෙන්."

බෞධාචාර්ය හිමියෝ දිගටම කතා කරගෙන යති.

ජයමංගල ගාථා කීමෙන් පසුව අපි ආබිවිවාද ගාථාව කියනවා. "සබ්බිතියෙයෝ විවජ්ජන්ති සම්බ වෝ විනාසනිදා..." ආදී වශයෙන්. ඉන් පස්සෙ 'සබ්බ පාපස්ස අකරණං' ගාථාව කියනවා. මේ අස්ථාවා වනථිට මහාලයන් මහාලියන් අත මල් මාලා දෙකක් හිමියොවා.

මේ ගාථා ක්‍රියා පලමුවැනි වරට සාධූ කියාගෙකාට මහාලිය මහාලයාගේ කරට අර මල් මාලය දානවා. ඉන් පසුව දෙවැනි වරට සාධූකාර දෙන විට මහාලයා මහාලියගේ කරට අැගේ අත තියෙන මල් මාලය දානවා. තුන්වැනි වරට සාධූකාර දෙන විට නැයිනි මිත්‍රයන් අතේ තියාගෙන ඉන්න මල් මහාල යුවළ දිහාට වීසි කරනවා. ඒ සඳහා දානස්පෙෂියා වැනි මල් පෙති ගුලා සූදානම් කරගෙන තියාගෙන ඉන්නවා. ඒක හරියට මල් වරුසාවක් වගේ මහාල යුවළට ආශීර්ෂ ඇදගැලෙනවා.

ඒවිවිවාදු ගාථා කියාගෙනයි මගෙ හඬ මෙකුලෝපෙයට හරියැටි එන්නෙ නැතිනි මම මාස්ක් එක ගැලෙව්වා.

මම තිහක්නෙ ඒ ටික වෙලාවේ මම මාස්ක් එක නැතිව තමයි හිටියෙ. මම තිහන්නෙ ඔය වෙලාවෙදි තමයි මට එතැන හිටි කාගෙන් හරි කොරෝනා වධරක් එක ඇතුළු වෙන්න ඇත්තෙත.

'දැන් බව වඩන්සේව බලා තියා ගන්නෙ කවුද?'

"මගෙ පන්සලේ ගෝලයෝ විසිඅට දෙනෙක් ඉන්නවා. ඒගොල්ලොත් තමා මාව බලාගන්නෙත. ඒ අය හුගක් හොඳ අය. ඒ නිසා කොරෝනාවලින් ලොකු පිරිහිසාක් නෑ. ඒත් මම දෙස්තර මහත්තුරු කියපු විදියට හුගක් පරිස්සම්වෙන් තමයි කාරියට වෙලා ඉන්නෙ."

නාෂ්ටුර්වල මහරෝහා වසංගතය ඔසුවෙන් පැහිර යන බව පවසන්නේ එහි පදිංචි ශ්‍රී ලාංකික විතු ශිල්පිනියක වූ චාමිනී රත්නසේකරය. ඇය විවාහ වී සිටින්නේ ඉන්දියාව ජාතික බැංකු නිලධාරියකු වන පරිනාම් සර්දේ සමයය. ඔහු නිදහස තෙලිහි ජනතාවට සුබසාධනය සපයන සංවිධානයක මූලික වී කටයුතු කරයි.

"බහුතරයක් ගෙවල්වල එක්කෙනෙක් හරි නැතිවෙලා තියෙනවා. මගෙ මහත්තයාගේ වවුලෙ හතර දෙනෙක් නැති වුණා. ලොකු නාත්තගෙ පුතා, නාත්තගෙ මල්ලිගෙ නෝනා, අම්මගෙ මල්ලි, තවත් පුංචි අම්මා කෙනෙක්. අපේ මේ ගෙවල් දෙක තුනක් විතරයි මේරිලා තියෙන්නෙ.

ඒත් ලංකාවෙ වගේ අපට ගෙවල්වලට වෙලා ඉන්න විදිහක් නෑ. ලංකාවේ මහගෙ ගෙවල්වල වතුපිටි තියෙනවා. මේකෙ මෙහෙ මං. ළඟ ළඟ තමයි ගෙවල් තියෙන්නෙ. ඒක නිසා හැඟෙනවා වැඩියි.

මෙහෙ තියෙන ලොකුම ප්‍රශ්නෙ තමයි ඉස්පිරිතාලවල ඇඳන් නැතිකම. ලෙඩෙකුට ඇඳක් ගන්න හරිම අමාරුයි. ආණ්ඩුවේ ඉස්පිරිතාල පිරිලා.

මගෙ මහත්තයාට මුළුන්ගේ නිදහස සංධිඨානයත් එක්ක එකතු වලා ලෙඩවුන්ට ඇඳේ හොයලා දෙන්න මහන්සි වෙනවා. එයා වැඩ කරන්නෙ බැංකුවක. දැන් සභියකට දවස් තුනක් විතරයි වැඩ කරන්නෙ. අනෙක් දවස්වලට ගෙදර ඉඳන් වැඩ කරනවා."

'මේ විදියට එළියට පහළියට යන්න බය හිතෙන්නෙ නැද්ද?'

"බයවෙලා කෙරන වෙලාවේ නෙවෙයි. දැන් මගෙ මිනිස්සුන්ව මෙහෙ සාමාන්‍ය දෙයක් වෙලා. දස්සාවටත් යන අය දස්සාවල්වලට යනවා, ඉගෙන ගන්න අය ඒ කටයුතු කරගෙන යනවා.

මගෙ මහත්තයගෙ අම්මා ගෙදියක්. ඒ නිසා මහත්තයා වගේම අම්මත් ලෙඩවුන්ට බය නෑ. මුළුන් ලෙඩවුන්ද උදව් කරන්න මහන්සි වෙනවා. අඳුන් මහත්තයා ගියේ ලෙඩවුන්ට ඇඳක් හොයලා දෙන කටයුත්තකට.

ඉස්පිරිතාල පිරිලා නිසා ලෙඩකුට ඇඳක් විතරක් ගන්න සහභාව පෙන්වලින් රෝහල්වල ලංකාවෙ සල්ලිවලින් ලක්ෂ ගණ විතර ඉල්ලනවා, අහසක් පියාඹ නැහිලි. ඒක තමයි තත්ත්වය.

ඉස්පිරිතාලවල මියරෙන අය ගෙවල්වලට ගේන්න නෙ. මරණයක් වුණා කියලා අපි දැනගන්නෙත් අේ ඉස්සරහා ගෙන යන විට විතරයි. මරණයක් වෙලා දවස් තුනක් ගියාම ගේ ඉස්සරහ හරි එකක් ගහලා අපට ගෙවල්වලට කැම බීමත් බෙදනවා. ඒ හරිවැඩින් තමයි මරණයක් වෙලා කියලා අපි දැනගන්නේ, ඒ ගෙවී හරි දවස්වල ගෙවල් ගොනොමයක දැක ගන්න ලැබෙනවා.

හට එකේ කැම බීමත් බෙදන එක හැැරුණු විට මියයිය පුද්ගලයා වෙනුවෙන් කැම පිංගාකක් මහ පාරේ තත්ත්වක වගේ තැනක තියෙනවා. හරියට ලංකාවෙ මොන්ටිස් තුටු හත්වැදිවල තියෙනවා වගෙ, ඒ වගේ කැම පිහෙන් තියෙලා මේ දවස්වල පාරෙ හැම තැනම දක්නන පුළුවන්."

කොරෝනාව වසංගතයෙන් ආපසිමින ලෙස බැට කෑන අවස්ථාවකදී වවා ඉන්දියානු බෞද්ධයෝ ද තමන් දඳවන බෞද්ධායන් ඇසුර බිරින් විරින් ඉටුකරන්නට අමතක නොකරති.

රොඩ්නි විදනපතිරණ